# අඛණ්ඩ මුදාහැරීමේ සහතිකපත් (CDC) එක් දින සේවාව (One-day Service) යටතේ නිකුත් කිරීමේ ක්‍රියාවලිය

වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් නාවිකයන්ගේ අවශ්‍යතාවයන්ට මූලිකත්වය දෙමින්, අඛණ්ඩ මුදාහැරීමේ සහතිකපත් (CDC) එක් දිනක් තුළ නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

ඒ අනුව, CDC ලබා ගැනීමේ එක් දින සේවාව යටතේ CDC ලබා ගැනීම සඳහා නාවිකයන් විසින් සපුරාලිය යුතු අවශ්‍යතාවයන් හා නියමයන් පහත පරිදි වේ.

01. එක් දිනක් තුළ CDC නිකුත් කිරීමේ ක්‍රියාවලිය රාජකාරි දිනවලදී පමණක් ක්‍රියාත්මක වේ.

02. එක් දින සේවාව යටතේ දිනකට භාර ගනු ලබන අයදුම්පත් සංඛ්‍යාවේ උපරිමය 10කට සීමා වේ.

03. එක් දින සේවාව සඳහා අයදුම් කල හැක්කේ පෙ. ව. 10.30 දක්වා පමණක් වන අතර, ඉන් පසුව අයදුම්පත් භාර ගනු නොලැබේ.

04. **එක් දින සේවාව සඳහා අයදුම් කල හැක්කේ, මාර්ගගත ක්‍රමයට CDC අයදුම්පත්‍රය ඉදිරිපත් කර යොමු අංකයක් (Reference No) ලබාගෙන ඇති සහ සහතිකපත් හා ලේඛණ Scan කර අවසන් කර ඇති අයදුම්කරුවන් හට පමණි.**

05. එක් දින සේවාව සඳහා අයදුම්කිරීමට බලාපොරොත්තුවන නාවිකයන්, **ඉහත 04 වන කොන්දේසියේ නියමයන් සම්පූර්ණ කල පසුව**, පහත වෙබ් සබැඳිය හෝ QR කේතය ඔස්සේ (CDC) එක් දින සේවාව සඳහා ලියාපදිංචි විය යුතුය.

http://www.dgshipping.gov.lk → One day Service

CDC & SID One Day Services

06. **අඩුපාඩු හා දෝෂ සහිත** අයදුම්පත් සහ **පූර්ව අනුමැතියක් අවශ්‍ය** පාඨමාලාවන් හදාරා ඇති අයදුම්කරුවන් විසින් යොමු කරන ලද අයදුම්පත් (එනම් Other Rank, NVQ සහතික හෝ STCW ප්‍රධාන පුහුණු පාඨමාලාවන් හදාරා නොමැති අයදුම්කරුවන්) එක් දින සේවාව යටතේ CDC නිකුත් කිරීමේ ක්‍රියාවලියෙන් ඉවත් කරනු ලැබේ.

07. එක් දින සේවාව සඳහා CDC ගාස්තුවට අමතරව **රු. 5,000/- ක අමතර මුදලක්** ගෙවිය යුතුය.

08. පද්ධතිය තුළ පැන නගින තාක්ෂණික දෝෂ හා නොවැලක්විය හේතු මත පූර්ව දැනුම්දීමකින් තොරව එක් දින සේවාව යටතේ CDC නිකුත් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමට සිදුවිය හැකි බවද කාරුණිකව දැනුම් දෙමි. එවැනි අවස්ථාවලදී එක් දින සේවාව සඳහා ගෙවා ඇති අමතර ගාස්තුව අයදුම්කරු වෙත ආපසු ලබා දෙනු නොලැබේ.

විමසීම - 011 – 2105701

වෙළඳ නාවික අධ්‍යක්ෂ ජනරාල්